<u>**පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සහසම්බන්ධතාවය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය**</u>

## නිගමන

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සහසම්බන්ධතාවය ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් හඳුනාගත් පහත නිගමන පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය නොපමාව යොමුකළ යුතුව ඇත.

- පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු මුදල් මුදා නොහැර දිගු කාලයක් පළාත් සභා අරමුදලේ රඳවා ගැනීමට කටයුතු කිරීම. පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු උදෙසා භාවිත කළ යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කලට වේලාවට නිදහස් නොකොට පළාත් සභා අරමුදලේ රඳවා තබාගැනීම එම අයතනනවල ප්‍රතිපාදන භාවිතා කිරීමට ගැටළුවක් බවට පත්වීම.
- මධ්‍යම රජය යටතේ පළාත් පාලනය ක්‍රියාත්මක වූ අවධියේ එම අරමුදල් සෘජුව පළාත් පාලන ආයතනවලට ලැබීම හේතුවෙන් සංවර්ධන කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට හැකිවීම. මෙලෙස පළාත් සභා මඟින් පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු අදායම් කලට වේලාවට මුදා නොහැර රඳවා තබා ගැනීම පළාත් පාලන ආයතනවල සේවා සැපයුම් ක්‍රියාවළිය පසුගාමී මට්ටමකට පත්වීමටද බලපා ඇති බව.
- 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 13 වන සංශෝධනය පරිදි පළාත් සභා ක්‍රමය හඳුන්වා දී දශක තුනකටත් වඩා වැඩි කාල පරිච්ඡේදයක් ගතවී තිබෙන පසුබිමක එතෙක් මධ්‍යම රජයේ එක් ප්‍රධාන විෂයක් වශයෙන් ක්‍රියාත්මකව පැවති පළාත් පාලනය පළාත් සභාවල එක් විෂයක් බවට පත්වීමත් සමඟ මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අතර පවත්නා සහසම්බන්ධතාවය ඒවායේ උන්නතිය උදෙසා අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවන බව.
- පළාත් සභා හඳුන්වාදීම හා පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ පාලනයෙන් ඉවත්කොට පළාත් සභා වෙත පැවරීම මඟින් එතෙක් තනි දෙපාර්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන විෂය පළාත් පාලන දෙපාර්තමේන්තු නවයකට විමධ්‍යගත කිරීමෙන් එක් දෙපාර්තමේන්තුවක්ව පැවති සමයේ පළාත් පාලන ආයතන නියාමනය වූ ආකාරයෙන් දෙපාර්තමේන්තු නවයක් යටතේ ප්‍රශස්ත කළමනාකරණයක් සිදුනොවනබව.
- ආණ්ඩුකාරවරයාගේ හා පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබිය යුතු කටයුතු සඳහා දිගු කාලයක් ගතවීම සහසම්බන්ධතාවය පවත්වාගෙනයාම දුර්වලවීම උදෙසා බලපා ඇති බව.

- පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධනය කරගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන බදු හා ගාස්තු අය කිරීම සඳහා සභාවලින් සම්පාදනය කොට පළාත් සභාවල අනුමැතිය සඳහා යොමු කරනු ලබන අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැතිය ලබාදීමට දිගු කාලයක් ගතවීමද, පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබිය යුතු කටයුතු සඳහා දිගු කාලයක් ගතවීමද පළාත් පාලන ආයතනවලට ගැටළුකාරී පසුබිමක් නිර්මාණය කොට ඇති බව.
- පළාත් පාලන සේවය අහෝසිකොට පළාත් සභා මඟින් හඳුන්වාදුන් පළාත් රාජ්‍ය සේවාව පළාත් පාලන ආයතනවල විෂය කටයුතු කරගෙන යාමට හැකි නිලධාරී කණ්ඩායමක් සැපයීමට අපොහොසත්වීම. පළාත් පාලන විෂය පිළිබඳ දැනුම එවක පළාත් පාලන ආයතන පද්ධතිය අතර බෙදී ගිය බැවින් වඩාත් සාර්ථක සේවා සැපයුම් ක්‍රියාවලියක් සැපයීමට එම කාර්ය මණ්ඩලවලට හැකි වී ඇත.
- පළාත් සභාවල ප්‍රාග්ධන වියදම්වලට සාපේක්ෂව පුනරාවර්තන වියදම් වැඩි මට්ටමක පවතින අතර ඒවායින් බහුතරයක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ හා සෞඛ්‍ය අංශවල වියදම් වශයෙන් භාවිතා වීම.මේ නිසා පළාත්වල සංවර්ධනයට හා පළාත් පාලන ආයතනවල අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- දෙවන ස්ථරයේ ක්‍රියාත්මක වූ පළාත් පාලනය තෙවන ස්ථරය බවට පත් වී දෙවන පාලන ස්ථරය බවට පළාත් සභා පත්වීමෙන් පසු මෙම ස්ථර දෙක අතර බෙදී ගොස් ඇති බලතල ඒවායේ උන්නතිය උදෙසා අන්නෝන්‍ය වශයෙන් භාවිතාකොට ඇත්තේද, එමඟින් බලය විමධ්‍යගතකරන ක්‍රියාවලියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්වී තිබේද යන්න මතභේදයට තුඩුදී ඇති බව.
- ප්‍රායෝගිකව ඒකීය වගකීමක් හෝ බලයක් පළාත් සභාවලට නොමැති වීම.13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ලැයිස්තු තුනක් මඟින් පැවරී ඇති බලතල ව්‍යවස්ථාදායකයට යටත්කොට තිබීම හා අවශ්‍ය විටෙකදී මධ්‍යම රජය වෙත පවරා ගැනීමට ඇති හැකියාව ඒවායේ ස්වාධීනත්වයට බලපා තිබීම.
- පළාත් සභා මඟින් එතෙක් පැවති පළාත් පාලන සේවය අහෝසිකොට හඳුන්වාදුන් පළාත් රාජ්‍ය සේවාව මඟින් පළාත් පාලන ආයතනවල විෂය කටයුතු කරගෙන යාමට හැකි නිලධාරී කණ්ඩායමක් සැපයීමට අපොහොසත්වීම පළාත් පාලනය දුර්වලවීමට බලපා තිබීම.
- විශාල ජනගහනයක් වෙසෙන ඉන්දියාව වැනි රටකට ගැළපෙන පරිදි සකස්කරන ලද බලය බෙදාහැරීමේ ව්‍යුහයක් අඩු ජනගහනයක් හා අඩු භූමි ප්‍රමාණයක් ඇති රටකට නොගැලපීම. මෙම තත්ත්වය පළාත්වල භූගෝලීය, පාරිසරික හා සමාජීය විෂමතාවන් ඇතිවීමට බලපා තිබීම.

- පළාත් පාලන ආයතනවලට තවදුරටත් බලතල ලබානොදීම. පළාත් සභා ආරම්භයේ පටන් පළාත් පාලන ආයතනවල කටයුතු ශක්තිමත් කිරීම, විධිමත්කිරීම උදෙසා බලතල තවදුරටත් ලබාදීමට කිසිදු පළාත් සභාවක් මේ දක්වා ක්‍රියාකොට නොමැති වීම.
- මධ්‍යම රජය සතුව තිබූ බලතල යම් ප්‍රමාණයක් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සභාවලට පැවරුනද, ඒවා පළාත් පාලන ආයතනවල උන්නතිය උදෙසා යොදාගැනීම සිදු වී ඇති බවක් නිරීක්ෂණය නොවීම. පළාත් සභා මඟින් එවැනි සහායක් කලට වේලාවට නොලැබීම පළාත් පාලන ආයතනවලට සිදුකර ඇති බලපෑම ඒවායේ සැපයුම් ක්‍රියාවළිය පසුගාමීත්වයට පත්වීම උදෙසාද බලපා ඇති බව.
- පළාත් පාලන ආයතන නියාමනය කිරීම සඳහා පළාත් සභා පනතින් පැවරී ඇති බලතල කොතෙක් දුරට පළාත් පාලනයේ උන්නතිය උදෙසා භාවිතාකොට තිබෙන්නේද යන්න වර්තමාන පළාත් පාලනය අධ්‍යයනය කිරීමේදී ගැටළුකාරී පසුබිමක් නිර්මාණය කොට ඇති බව.
- පළාත් පාලන ආයතනවල ස්වාධීනත්වයට බලපෑම. පළාත් පාලන ආයතන ආඥාපනත් හා පනත් මඟින්  පිහිටුවා ඇති නෛතික පසුබිමක් සහිත ව්‍යවස්ථාපිත ආයතන පද්ධතියක් බැවින් ඒවාට ස්වාධීන පැවැත්මක් ලැබී ඇත. එහෙත් පළාත් සභා පිහිටුවීමෙන් පසු පළාත් පාලන ආයතනවල අරමුදල් රැස්කිරීම හා භාවිතය වැනි කටයුතුවලට පළාත් සභාවල මැදිහත්වීම පළාත් පාලනය දුර්වලවීමට බලපා ඇති බව.
- පළාත් සභාවෙන් ලබා දෙන සේවය සම්බන්ධයෙන් මහජනතාව තුළ පවත්නා අප්‍රසාදය. මධ්‍යම රජය මඟින් ඉටුකරන ලද කාර්යභාරය පවත්වාගෙන යාම සඳහා අතරමැදි ආයතන පද්ධතියක් ස්ථාපිත වීම තුළින් පළාත් පාලනයට සිදු වී ඇති බලපෑම.
- පළාත් සභා මඟින් පළාත් තුළ ආවේණික ගැටළු විසඳාගැනීමට ලැබී ඇති හැකියාව ප්‍රමාණවත් පරිදි භාවිතාකොට නොතිබීම. මෙය පළාත් සභා ක්‍රියාත්මක වීමේ ධනාත්මක ලක්ෂණයක් වුවද එවැනි ක්‍රියාමාර්ග සඳහා පළාත් සභා බොහොමයක ප්‍රමාණවත් අවධානය යොමු වී නොමැති බව. මේ සම්බන්ධයෙන් යම් පමණක පියවර හෝ ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ වයඹ පළාත පමණක් වීම.
- මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මකවන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් කරනු ලබන සංවර්ධන කටයුතු පළාත් සභා මඟින් හා පළාත් පාලන ආයතන මඟින් නිවැරදි සම්බන්ධීකරණයක් නොවීමද, එම ආයතන අතර සහසම්බන්ධතාවය පවත්වාගෙනයාම දුර්වලවීමට හේතු වී ඇති බව.
- පළාත් සභා යටතේ පවත්නා ප්‍රධාන තනතුරු දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ වීම. එමඟින් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධාරීන් පළාත් සභාවේ කිසියම් තනතුරකට පත්වීමෙන් පසු අදාළ පළාත් සභාවේ අනන්‍යතාවයට අදාළ නීති සම්පාදනයට ප්‍රමුඛතාව ලබාදීමට වඩා ප්‍රතිපත්තිමය හා පරිපාලනමය කරුණු සඳහා යොමුවී කටයුතු කළයුතුවීම. මෙම තත්ත්වය

ප්‍රඥප්ති සම්පාදනයකොට ක්‍රියාත්මක කිරීමෙන් පළාත්වල ආදායම් වර්ධනය කරගැනීම උදෙසා ක්‍රියාත්මකවීමටද බලපා ඇතිබව.

- දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් පළාත් සභාවල තනතුරු බොහොමයක් පුරප්පාඩුව පැවතීමත් පළාතේ සංවර්ධනය උදෙසා ප්‍රඥප්ති සම්පාදනය සම්බන්ධයෙන් අඩු සැළකිල්ලක් දැක්වීමට බලපා තිබීම. පළාත් සභාවල එම අවශ්‍යතාවය හඳුනා ගන්නා කාල සීමාව වනවිට ඒ සඳහා කටයුතු කළයුතු අදාළ නිලධාරීන් ස්ථාන මාරු වියයුතු කාල සීමාවට එළඹීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන පද්ධති දෙක අතර අන්‍යොන්‍ය අවබෝධය දුර්වලවීම තුළින් ඇතිවී තිබෙන දුරස්ථභාවය ඒවායේ සම්බන්ධීකරණය දුර්වලවීමට හා ක්‍රියාත්මකවීමට බලපා තිබීම.
- උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පැවති අර්බුදයට විසඳුමක් වශයෙන් හඳුන්වාදුන් පළාත් සභා දිවයිනේ අනෙකුත් පළාත් හත තුළද ක්‍රියාත්මක වීමත් සමඟම තවත් දේශපාලන අධිකාරියක් හා නිලධාරී තන්ත්‍රයක් නඩත්තු කිරීමට සිදුවීම තුළින් අමතර වැය බරක් දැරීමට සිදුවී ඇති බව හා පරිපාලන ක්‍රියාවලිය සංකීර්ණ වී තිබීම.
- මුදල් කොමිසමේ නිර්දේශ පදනම් කොටගෙන පළාත් සභා සඳහා ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. පළාත්වලින් වාර්ෂිකව රැස්කරගනු ලබන දත්ත හා තොරතුරු පදනම්කොට පළාත් සභාවල කටයුතු පවත්වාගෙන යාම සඳහා ලබාදෙන සීමිත ප්‍රතිපාදන පළාත් සභා සඳහා ප්‍රමාණවත් නොවීම හා එම තත්ත්වය පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතුවලටද බලපා තිබීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 21 වන ඡේදයේ පරිදි පළාත් තුළ ආදායම් උත්පාදනයට යොමුවීමට ලබාදී ඇති ප්‍රතිපාදන මත උතුරු හා නැගෙනහිර පළාත් සභා දෙක මඟින් මෙතෙක් එකම ප්‍රඥප්තියක් හෝ පනවා ගැනීමට කටයුතුකොට නොමැතිවීම එම පළාත්වල පළාත් පාලන ආයතනවල හා පළාත් සභාවල උන්නතිය උදෙසා බලපා තිබීම.
- පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයින් අතර අන්‍යොන්‍ය සම්බන්ධීකරණයක් නොමැතිවීම හා ඔවුන් තම කොට්ඨාශවලට පමණක් සේවය කිරීමට යොමුවී තිබීම. එසේම එම තත්ත්වය මෙම ආයතන පද්ධති දෙක අතර නිසි සම්බන්ධීකරණයක් නොවීමටද සංවර්ධන කටයුතු ද්විකරණයවීමටද බලපා තිබීම.
- පළාත් සභා මඟින් පනවාගෙන ඇති ප්‍රඥප්ති හා චක්‍රලේඛ විෂමතාවයන් පැවතීම. පළාත් සභා මඟින් පනවාගෙන ඇති ප්‍රඥාප්තිවල හා නිකුත්කොට ඇති විවිධ චක්‍රලේඛවල පවත්නා පරස්පරතාවන් සෑම පළාත් සභාවක්ම සමගාමීව ක්‍රියාත්මක නොවීමටද පළාත් පාලන ආයතන අතර සහසම්බන්ධතාවය පවත්වාගෙනයාම දුර්වලවීමටද බලපා තිබීම.
- බඳවාගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවල සමගාමීබවක් නොමැතිවීම. මේ හේතුවෙන් එක් එක් පළාත් සභා විවිධාකාරයෙන් ඒ සඳහා කටයුතු කිරීම සේවා සැපයුම් ක්‍රියාවළිය

දුර්වලවීමට බලපා ඇතිබව. උදාහරණ වශයෙන් සමහර පළාත්වල පළාත් පාලන ආයතනවල සහා ලේකම් තනතුරු සඳහා සංවර්ධන නිලධාරීන් පත්කොට තිබීම හා තවත් පළාත්වල පළාත් පාලන ආයතනවල සභා ලේකම් තනතුරුවලට කළමනාකාර සහකාරවරුන් පත්කිරීමට කටයුතු කිරීම.

- පළාත් පාලන විමර්ශන නිලධාරී සේවය සම්බන්ධයෙන් එක් එක් පළාත් සභාවල ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවල පවත්නා පරස්පරතාවයන් හා කාර්ය පැවරීම් ඔවුන්ගෙන් පළාත් පාලන ආයතනවලට ලැබියයුතු නිසි දායකත්වය අවමවීමටද බලපා තිබීම. සබරගමුව පළාතේ විමර්ශන නිලධාරීන් ක්‍රියාත්මක නොවන අතර, ඒ කාර්යය ප්‍රජා සංවර්ධන නිලධාරීන් ලවා කරවා ගනී.
- පළාත් සභා හා පළාත් පාලන පද්ධති දෙක මඟින් සිදුකරනු ලබන බිම් මට්ටමේ සංවර්ධන කටයුතු සේවා සැපයුම් ක්‍රියාවලිය ඉහළ නැංවීම තුළින් මහජන සුභසිද්ධියට අදාළ කරගත හැකි පරිදි අන්‍යොන්‍ය වශයෙන් නිවැරදි අවබෝධයකින් කටයුතු සිදුනොවීම.
- පළාත් සීමා හා පළාත් පාලන ආයතන සීමා නිර්ණයකොට බෙදා ඇති ආකාරය සම්පත් විභේදනයකට හේතුවී ඇතිබව. මෙම තත්ත්වය පළාතේ සම්පත්වල ප්‍රයෝජන අදාළ පළාතට අහිමිවීමටද, අදාළ ප්‍රදේශවලට අහිමිවීමටද බලපා තිබීම. මෙම තත්ත්වයන් පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල අසමතුලිතතා ඇතිවීමටද බලපා තිබීම.
- සැළසුම් සම්පාදන ක්‍රියාවලියේ ඒකාකාරී බවක් නොමැතිවීම.
- ආයතනවල සහසම්බන්ධතාවය පවත්වාගෙන යාම උදෙසා  නිලධාරීන් දේශපාලනීකරණය වීම බලපා තිබීම.
- මධ්‍යම රජයේ හා පළාත් සභා නිලධාරීන් අතරත් පළාත් පාලන ආයතනවල නිලධාරීන් අතරත් සහයෝගීතාව හා සම්බන්ධීකරණය දුර්වල මට්ටමකින් ක්‍රියාත්මක වනබව.
- දේශපාලන බලධාරීන්ගේ මැදිහත්වීම පළාත් සභා,පළාත් පාලන ආයතන හා මධ්‍යම රජය යන පාලන පද්ධති තුන අතර සහසම්බන්ධතාව පවත්වාගෙන යාම උදෙසා බලපා ඇතිබව.
- දැනට පළාත් රාජ්‍ය සේවයේ ආයතන ප්‍රධානී තනතුරු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු වීම. එම තනතුරුධාරීන් පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත කරනු ලැබුවද ඔවුන් මධ්‍යම රජයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු දරන්නන් ලෙස කටයුතු කිරීම.
- මධ්‍යම රජයේ විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රේඛීය අමාත්‍යාංශ ගණනාවක් ස්ථාපිතකොට පවත්වාගෙන යනු ලබන අතර, නැවත එම අමාත්‍යාංශවලට අදාළ කාර්යයන් සඳහාද අතරමැදි අමාත්‍ය මණ්ඩලයක් හා නිලධාරී තන්ත්‍රයක් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ යටතේත් ක්‍රියාත්මක වීම මඟින් කාර්යයන් ද්විකරණයවීම පළාත් පාලන ආයතන කාර්යයන් සම්බන්ධීකරණය දුර්වලවීමටද බලපා ඇතිබව.

- පළාත් සභා අරමුදලට ආදායම් රැස්කර ගැනීමට අදාළවන පළාත් සභා ලැයිස්තුවේ 36.3 සිට 36.20 දක්වා ලැබී ඇති ප්‍රතිපාදන භාවිතාකොට පළාත්වල ආර්ථික අභිවෘද්ධිය උදෙසා ආදායම් උත්පාදනයට පළාත් සභාවල ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබීම.
- දීප ව්‍යාප්ත සේවාවන්වලට අදාළ පළාත් සභා තනතුරු බොහොමයක් පුරප්පාඩුව පැවතීම පළාත්වල අභිවෘද්ධිය උදෙසා ප්‍රඥප්ති සම්පාදනයට හා පළාත් පාලන ආයතන උදෙසා අවධානය යොමුනොවීමටද බලපා තිබීම.
- පළාත් සභා සතු ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රඥප්ති සම්පාදනයකොට ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය/ වැදගත්කම පළාත් සභා මඟින් හඳුනාගෙන නොතිබීම හා ඒ සඳහා ක්‍රියාත්මක නොවීම පළාත් පාලන ආයතන උදෙසාද බලපා තිබීම.
- පළාත් පාලන ආයතනවල කටයුතු පවත්වාගෙන යාම උදෙසා මධ්‍යම රජය විසින් පළාත් සභා හරහා ලබාදෙන ප්‍රතිපාදන මත යැපීමට සිදුවීම.
- පළාත් පාලන ආයතනවලට ස්වයං උත්පාදන කටයුතු සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය පළාත් සභාව මඟින් ලබාගැනීමට සිදුවීම තුළින් ඔවුන්ගේ ස්වයං උත්පාදන ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවැතීම.
- පළාත් රාජ්‍ය සේවය පිළිබඳ සම්පූර්ණ බලතල පළාත් සභාවලට පවරා නොතිබීම පළාත් පාලන ආයතනවල මානව සම්පත් කළමනාකරණයට බලපා තිබීම.
- තර්කානුකූලව බලය බෙදාහැරීම සිදු වී නොතිබීම. දිස්ත්‍රික් ලේකම් කාර්යාල පළාත් සභා යටතේ ක්‍රියාත්මක නොවීමත්, පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයෙකු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්වරයෙකු ක්‍රියාත්මක වීමත් මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම උදෙසා බලපා තිබීම.
- පළාත් සභා ප්‍රතිපත්ති සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්තිවල සහාය ලබාගැනීමේ දුර්වලතාවයන්.
- දැනට ක්‍රියාත්මකවන පරිපාලනමය ධූරාවලිවල විෂමතාවයන් පැවතීම.
- සැළසුම් සම්පාදන කටයුතුවල ඒකාකාරීබවක් නොමැතිවීම.
- පළාත්වල පාරිසරික බලපෑම් පිළිබඳ අවධානය යොමුනොවීම.
- පළාත් සභා යටතේ ක්‍රියාත්මක විෂයන්ට සමබරව මුදල් නොලැබීම. මෙම තත්ත්වය සේවා සැපයුම් ක්‍රියාවලිය බිම් මට්ටමින් පවත්වාගෙන යන පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදීමට බලපා තිබීම.
- වාර්ෂිකව පළාත් සභාවලට ලැබෙන ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් පසුගිය වසරවල හිඟ මුදල් ගෙවීමට යොදාගැනීමට සිදුවීම හේතුවෙන් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වෙන්කළ හැකි ප්‍රතිපාදන ප්‍රමාණය අවමවීම. පළාත් සභාවල උපමාන පාදක ප්‍රදාන යටතේ නිකුත් කරනු ලබන ව්‍යාපෘති සැලසුම් නිකුත් කිරීම අදාළ වර්ෂයේ අවසන් අර්ධය තුළ දී සිදු වීම නිසා, ඊළඟ

වර්ෂයේ ප්‍රතිපාදන යොදා ගෙන අවිච්ඡේද ව්‍යාපෘතිවලට ගෙවීමට සිදු වීම ද මෙයට බලපා තිබෙන බව.

- විදේශ ප්‍රදාන යොදාගැනීම සඳහා පළාත් සභාවලට නිසික්‍රමවේදයක් නොමැතිවීම.
- පළාත් සභාවල වාර්ෂික ප්‍රතිපාදනවල සංශෝධන සිදුකරගැනීමට කටයුතු කිරීමේදී ඒ සඳහා විශාල කාලයක් ගතවීම සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම අඩාලවීමට බලපා තිබීම. මෙම තත්ත්වය සංවර්ධන කටයුතුවල ප්‍රමුඛතාවය මත හා මතුවන ප්‍රායෝගික අවශ්‍යතාවයන් මත වැය සංශෝධනය කිරීමට අපහසුවීම.
- පළාත් සභාවලට ප්‍රමාණවත් බලතල හිමිව නොතිබීම. උදාහරණ: ඉඩම්, පොලිස්
- පළාත් පාලන ක්ෂේත්‍රයට නිලධාරීන් ආකර්ෂණය නොවීම. රාජ්‍ය සේවයේ තනතුරු හා සැසඳීමේදී ඒවා පළාත් පාලනයට නොලැබීම හේතුවෙන් පළාත් රාජ්‍ය සේවයට සම්බන්ධවීමට කාර්යමණ්ඩලවල ඇති නොකැමැත්ත හා ස්ථාන මාරු යටතේ පැමිණෙන නිලධාරීන්ට වුවද කඩිනමින් වෙනත් රාජ්‍ය ආයතනවලට මාරු ලබාගැනීමට කටයුතු කිරීම පළාත් පාලන ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමනාකරණය බලපා තිබීම. මෙම තත්ත්වය පළාත් පාලන ආයතනවල සේවා සැපයුම් ක්‍රියාවලිය අඩාළවීමට ද බලපා තිබීම.
- පළාත් පාලන ආයතන සතු බලතල කිසිවක් පළාත් සභා වෙත හෝ මධ්‍යම රජය වෙත පවරා ගත නොහැකි වුවත් තවදුරටත් බලතල ලබාදීමට ඇති හැකියාව මත අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීම පළාත් පාලනයේ ප්‍රගතියක් ළඟා කරගැනීම උදෙසා බලපා තිබීම. මෙම තත්ත්වය පළාත් පාලනයේ උන්නතිය උදෙසා පළාත් සභාවල විශේෂ දායකත්වයක් සිදුවී නොතිබීමට බලපා තිබීම.
- මධ්‍යම රජය මඟින් එක් එක් විෂයන්ට අදාළව වරින්වර වෙනස් නොවන පොදු ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එහි ප්‍රතිවිපාක පළාත් සභාවලට මෙන්ම පළාත් පාලන ආයතනවලද කටයුතු ඒකාග්‍රව පවත්වාගෙන යාමට නොහැකි පසුබිමක් නිර්මාණය වී තිබීම.
- වරින්වර බලයට පත්වන ආණ්ඩු මඟින් සිදුකරන ප්‍රතිපත්තිමය වෙනස්කම් අනුව පළාත් සභාවලටද කටයුතු කිරීමට සිදුවීම මඟින් පළාත් පාලන ආයතනවල කටයුතු පවත්වාගෙන යාමටද බලපා තිබීම.
- ආදායම් ප්‍රවර්ධනය කරගැනීම සඳහා පළාත් සභා පනත මඟින් පළාත් සභා වෙත පවරා ඇති බලතල පළාත්වල උන්නතිය උදෙසා භාවිතාකොට නොතිබීම. මේ හේතුවෙන් දිගින් දිගටම මධ්‍යම රජයේ ප්‍රතිපාදන මත යැපීමට සිදුවීම පළාත් සභාවල සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම හා පළාත් පාලන ආයතනවල කටයුතුවලට දායකත්වය සැළසීමට නොහැකිවීම.
- සැළසුම් සම්පාදන කටයුතුවල ඒකාකාරී බවක් නොවීම. මධ්‍යම රජය පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව සකසනු ලබන සංවර්ධන සැළසුම්වලදී නිසි සම්බන්ධීකරණ

ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම. සැලසුම්වල ඒකාකාරී බවක් ඇතිකර ගැනීම සඳහා අනවශ්‍ය ද්වීකරණයක් සිදුවීමටද බලපා තිබීම.

## නිර්දේශ

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් හඳුනාගත් නිගමන ඒවායේ උන්නතිය උදෙසා යොදාගැනීම සඳහා පහත නිර්දේශ පිළිබඳ අවධානය යොමුකොට ප්‍රතිපත්ති සැළසුම් කිරීමට අදාළ අංශ කටයුතු කළ යුතුය.

- පළාත් පාලන ආයතන නියාමනය කිරීමේ පළාත් සභා සතු බලතල මඟින් පළාත් පාලන ආයතනවලට තම කාර්යභාරය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට ඇති බාධා ඉවත්කොට අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කිරීම හා දැනට ලැබී ඇති නියාමන බලතල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- පළාත් සභා ක්‍රමය තවදුරටත් සංවර්ධනය කිරීම. පළාත් සභාවලට ලැබෙන ප්‍රතිපාදන ඵලදායී සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමත්, අවශ්‍ය ප්‍රතිපාදන පළාත් පාලන ආයතනවලට ලබාදීමට කටයුතු කිරීමත් මඟින් පසුගාමී මට්ටමේ පවතින ආයතන බලගැන්වීමටත් අවශ්‍ය සහාය මධ්‍යම රජය මඟින් ලබාදීම.
- පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු මුදල් සෘජුව එම ආයතනවලට ලබාදීමට කටයුතු කිරීම. දැනට පළාත් සභා මඟින් රැස්කරනු ලබන මුද්දර ගාස්තු හා උසාවි දඩ පළාත් සභා සන්තකයේ රඳවා නොගෙන සෘජුව පළාත් පාලන ආයතනවලට මුදාහැරීමට කටයුතු කිරීම මඟින් එම ආයතනවල සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය අවම කිරීමට කටයුතු කිරීම.
- 1988ට පෙර ක්‍රියාත්මක වූ පළාත් පාලන සේවය නැවත හඳුන්වාදීම මඟින් පළාත් සභා ක්‍රමය යටතේ ක්‍රමයෙන් දුර්වල තත්ත්වයකට පත්වී ඇති පළාත් පාලන ආයතනවල මානව සම්පත් සංවර්ධන ගැටළු නිවැරදි කිරීමට කටයුතු කිරීම. නැතහොත් ඒ ඒ පළාත තුළ පළාත් පාලන ආයතන අතර පමණක් ස්ථාන මාරු සිදු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වදීම.
- පළාත් සභාවල ඵලදායීතාවය වැඩිකොට ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා සමගාමී ලැයිස්තු (තුන්වන ලැයිස්තුව) ඉවත්කොට පළාත් සභා ලැයිස්තු (පළමුවන ලැයිස්තුව) තවදුරටත් ශක්තිමත් කිරීම. එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එක් එක් පළාත් සභාවට අදාළව පළාතට අදාළ වන සේ නව වන උපලේඛනයේ පළමුවන ලැයිස්තුවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රඥප්ති සම්පාදනය කිරීම මඟින් පළාත් සභාවල ක්‍රියාකාරීත්වය වර්ධනය කරගැනීමට ඉඩකඩ සළසාදීම.
- පළාත් සභා සඳහා වැඩි මූල්‍ය බලතල ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කිරීම මඟින් පළාත් සභාවල ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම හා පළාත් පාලන ආයතනවල මූල්‍ය ශක්තිය වර්ධනය කිරීම මඟින් සේවා සැපයුම් ක්‍රියාවළිය ශක්තිමත් කිරීමට අවස්ථා සලසාදීම.

- පළාත් පාලන ආයතන මඟින් පළාත් සභාවේ අනුමැතිය ලබාගත යුතු කරුණු උදෙසා ප්‍රමාදවීම සම්බන්ධයෙන් අවධානය යොමුකොට ඒවා අවම කරගැනීමට සුදුසු වැඩපිළිවෙළක් නොපමාව ක්‍රියාත්මක කිරීම.
- පළාත් පාලනය ශක්තිමත් කිරීම. පළාත් සභා සතු පළාත් පාලනය යටතට පැවරිය හැකි යම් යම් බලතල එම ආයතනවලට පවරාදීම මඟින් පසුබෑමකට ලක්වී ඇති පළාත් පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම. (සමගාමී ලැයිස්තුවේ විෂය අංක 22 යටතේ ලැබී ඇති සංචාරක කටයුතු සංවර්ධනය හා පාලනය කිරීමේ බලතල පළාත් පාලන ආයතනවලට පවරා දීම වැනි)
- පළාත් පාලන ආයතන බලගැන්වීම. ඒ ඒ පළාත්වල පිහිටි පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කොට පසුගාමී මට්ටමක පවත්නා ආයතන සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් අතර නිවැරදි සම්බන්ධීකරණයක් ඇතිකිරීමට කටයුතු කිරීම. ආයතන දෙවර්ගය මඟින් එකම කාර්යය සිදුකිරීම වළක්වා ගැනීමට කටයුතු කිරීම හා මහජන නියෝජිතයින් අතර නිවැරදි සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම උදෙසා විධිමත් සම්බන්ධීකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම මඟින් සහසම්බන්ධතාව වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිවැරදි සම්බන්ධීකරණ ක්‍රියාවළියකට යොමුකිරීම මඟින් ද්විකරණ කටයුතු ප්‍රමාදතාවයන් හා මුල්‍ය නාස්තිය අවම කරගැනීමට කටයුතු කිරීම.
- පරිපාලනය පමණක් විමධ්‍යගත කිරීම.
- මධ්‍යම ආණ්ඩුවට වගකියන දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු කිරීමට හැකි බල ව්‍යුහයක් සකස් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන සම්බන්ධීකරනයකොට ඒවා ශක්තිමත් කිරීම.
- පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය නිසා සිදුවන අනවශ්‍ය සම්පත් නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම. පළාත් හා පළාත් පාලන වශයෙන් පද්ධති දෙකක් ක්‍රියාත්මක වීමේදී ඇතිවී තිබෙන ප්‍රයෝගික ගැටළු හා දුර්වලතාවන් හඳුනාගෙන බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියාවළියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලබාදිය හැකි ප්‍රයෝගික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීම.
- ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් ලබාදීම. පළාත් සභාවලට අවශ්‍ය ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි ලබාදීමට මධ්‍යම රජය කටයුතු කිරීම මඟින් පළාත් පාලන ආයතන කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- පවත්නා බලය බෙදාහැරීමේ ව්‍යූහය අධ්‍යයනය කොට එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- තවදුරටත් බලය විමධ්‍යගත කිරීම. පළාත් පාලන ආයතනවලට තවදුරටත් ලබාදිය හැකි බලතල සම්බන්ධයෙන් අවධානය යොමුකොට සියලු පළාත් සභා ඒකමතික තීරණවලට එළඹී අවශ්‍ය පියවර ගැනීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලැබීඇති බලතල භාවිතාකොට පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල උන්නතියට අදාළ ප්‍රඥප්ති සම්පාදනයකොට ක්‍රියත්මක කිරීම. මෙහිදී පළාත් සභා නවය හා ඒ යටතේ ක්‍රියාත්මකවන පළාත් පාලන ආයතන 341 සමගාමී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට යොමුකිරීම.
- ජාතික හා පළාත් වශයෙන් වෙනකොට ඇති බලතල හා වගකීම් නිවැරදිව අධ්‍යයනයකොට ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන පසුබිමක් නිර්මාණය කිරීම.
- ඒකාකාරී සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සියළුම පළාත් තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- තර්කානුකුල බලය බෙදා හැරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මඟින් පාලන ස්ථර තුන ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- රේඛීය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපත්ති සම්පාදනයකොට ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් සභාවලට ලබා දීම.
- මනා දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම මඟින් කාර්යයන් නිවැරදිව හඳුනා ගැනීම හා ද්වීකරණය වළකා ගැනීමට කටයුතු කිරීම.
- වරින්වර ආණ්ඩු වෙනස් වීම හේතුවෙන් වෙනස් නොවන ජාතික ප්‍රතිපත්ති සැකසීමට කටයුතු කිරීම හා ඒවා පළාත් සභා යටතේ ක්‍රියාත්මක කරවීමට සැලැස්වීම තුළින් පළාත් පාලනය සශක්තිමත් කිරීමට පියවර ගැනීම.